**නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (අදියර 01) - 2020**

---

නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (අදියර 01) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන ආයතනය (Agence Francaise De Development) අතර 2016 ජුනි 01 දින එළඹී අංක සීඑල්කේ 1013 – 01 කේ දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 (එච්) වගන්තිය සහ 2016 මාර්තු 16 දින එළඹී අංක සීඑල්කේ 1013-02 එල් දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය පහසුකම් හා මූල්‍ය ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු (අ) අප ජලය රැස්කිරීම හා පිරිපහදු පද්ධති ව්‍යාප්ත කිරීම සහ මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ 73,000 ක් වූ ජනතාවට සනීපාරක්ෂක සේවා ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා වැඩි දියුණු කිරීම (ආ) ජල හා සනීපාරක්ෂ අංශයේ ව්‍යුහය වැඩි දියුණු කිරීම හා විශ්ලේෂණය කිරීම (ඇ) දරිද්‍රතාව පිටු දැකීම සඳහා අවැසි දිළිඳු හිතකාමී ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම මගින් වරප්‍රසාද නොලත් නිවැසියන්ට සේවා ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා සැලසීම (ඈ) වෙරළාශ්‍රිත හා නාවික පරිසර පද්ධති ආරක්ෂාව සහ ජෛව විවිධත්ව නඩත්තුව සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,739.81 කට සමාන යූරෝ මිලියන 107.70 ක් වන අතර ඉන් රු.මිලියන 13,224 කට සමාන යූරෝ මිලියන 76 ක් ණයක් වශයෙන් සහ රු.මිලියන 991.81 කට සමාන යූරෝ මිලියන 5.70 ක් ප්‍රදානයක් වශයෙන් මූල්‍යායනය කිරීමට ප්‍රංශ සංවර්ධන ආයතනය එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 4,524 කට සමාන යූරෝ මිලියන 26 ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2022 ජුනි 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මඟින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය හා සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2 භෞතික කාර්ය සාධනය**

**2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| ක්‍රියාකාරකම් | 2020 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය | | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | අපේක්ෂිත | සත්‍ය | | |
| මීගමුව අප ජල අපහරණ පද්ධතිය සඳහා පොම්පාගාර සහිත අපජල රැස් කිරීමේ පද්ධතිය ඉදි කිරීම හා නිවාස සබඳතා ලබා දීම. | 2019 වර්ෂයේ සැප්තැම්බර් මස වන විට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණි. | 2021 ජුනි 30 දින වන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. | සැලසුම් හා අධීක්ෂණය කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදනය (ඩීඑස්සී) 2018.08.21 ආරම්භ කරන ලද අතර (අධ්‍යන අදියර මාස 18) ඒ අනුව, වැඩ කොන්ත්‍රාත් 2020 නොවැම්බර් ප්‍රදානය කිරීමට සැලසුම් කරන ලදී. කෙසේ වුවද, අප්‍රේල් 21 සිද්ධිය නිසා රජය විසින් දැඩි රෙගුලාසි හා රීතීන් පැනවීමෙන් ඩ්‍රෝන සමීක්ෂණය ප්‍රමාද විය. තවද, කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා ව්‍යාපෘති කටයුතු ප්‍රමාද විය. වර්තමානයේ කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා එස්එච්අයිඑෆ්ටී (SHIFT) ව්‍යාපෘතිය, ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කර ඇත. | ණය කාල සීමාව 2022 ජුනි මස අවසන් වන බැවින් ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| ව්‍යාපෘති ප්‍රදේශය තුළ වෙසෙන අඩු අදායම් ලාභීන්ගේ සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම. | 2018 ජුනි මස වන විට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණි. | 2021 ජුනි 30 දින වන විටත් කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබුණි. | කොවිඩ් තත්ත්වය මත ප්‍රමාදය සිදු විය. කෙසේ වුවද, කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කර ඇත. | කාර්යයන් කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| ඉඩම් අත්පත් කර ගැනීම. | මීගමුව ඉඩම් 12, ගාල්ලේ ඉඩම් 17 ක් හා උණවටුන ඉඩම් 07 ක් | ඉඩම් අත්පත් කර ගැනීම් ක්‍රියාවලිය සිදු කරමින් පවතී. | මීගමුව - අපජල පිරිපහදු පිරියත පිහිටි ඉඩම හා පොම්පාගාර දෙකක් සහිත ඉඩම් ඉතා වැදගත් ඉඩම් ලෙස හඳුනා ගන්නා ලදී. පරිච්ඡේද 4 පරිදි අපජල පිරිපහදු පිරියත පිහිටි ඉඩමේ විමර්ශන කටයුතු | ඉඩම්වල හිමිකම පවරා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නිමකර ඇති අතර තීන්දුව ලැබීමට නියමිතය. පොම්පාගාර සහිත ඉඩම් දෙක - පරිච්ඡේද 4හි විමර්ශනය අවසන් වීමෙන් පසු ඍජු මිලදී ගැනීම් ක්‍රමවේදය යටතේ ක්‍රියාකරනු ඇත. මීගමුව නගර සභාවේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉඩම්වලට ප්‍රවිශ්ටවීම සඳහා බාධා නොමැත. සෙසු පෞද්ගලික ඉඩම් 6හි ඉඩම් සම්බන්ධ කටයුතු දැනටමත් කඩිනම් කර ඇත. කොන්ත්‍රාත්කරුට ඉදි කිරීම් අදියරේදී ඉඩම් භාරදීමේ ඇතිවිය හැකි ප්‍රමාදයන් වැලැක්වීමට ඉහත පියවරවල් ගෙන ඇත. ගාල්ලේ හා උණවටුනේ ඉඩම් අත්පත් කර ගැනීම් දැනටමත් කඩිනම් කර ඇත. | |
| ප්‍රතිපත්ති හා ආයතනික වැඩි දියුණු කිරීම් උපදේශනය (පී.අයි.ඊ.සී) | 93% | 73% | ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ සිදු වූ ප්‍රමාදය, මූලික ප්‍රමාදයට හේතු විය. තවද , උනන්දුව දක්වන පාර්ශවයන් සමඟ සාර්ථක වැඩමුළුවක් පැවැත්වීම කොවිඩ් 19 වසංගතය නිසා අපහසු විය. | කාර්යයන් කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| මලාපවහන කළමනාකරණ කුසලතා වර්ධන උපදේශනය (එස්.එම්.එස්.ඩී.සී) | 2018 නොවැම්බර් මස වන විට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර නැත. | පැකේජ් 1 : (සේවා කොන්ත්‍රාත්තුව) එස් එම් එස් ඩී සී යටතේ කැමැත්ත ප්‍රකාශ කිරීම (ඊඕඅයි) ලියවිලි ඇගයීම් අදියර<br>පැකේජ් 2 : මලාපවහන අංශයේ ක්‍රියාත්මක හා නඩත්තු අංශය සඳහා මෙවලම් හා උපකරණ සැපයීම හා බෙදාහැරීමේ ලියවිලි ඇගයීම් අදියර<br>පැකේජ් 3 : එන්ඩබ්එස්ඩීබී හි පුහුණු | කාර්යයන් කඩිනම් කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා සහය වීම - ආරම්භක අදියර ප්‍රමාදයන් වැලැක්වීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කර ඇත. | |
| සැලසුම් හා අධීක්ෂණ උපදේශන (ඩී.එස්.සී) | 61% (මීගමුව, ගාල්ල සහ කැළණියේ ශක්‍යතා අධ්‍යනයන් කිරීම) | 35% (ප්‍රදේශ තුනෙහි ශක්‍යතා අධ්‍යනයන් කෙරෙමින් පවතී.) | 2019 අප්‍රේල් 21 සිදු වීම මත ඩ්‍රෝන සමීක්ෂණ තහනම් කිරීම හා ආරක්ෂාව සම්බන්ධ ගැටළු ඇතිවීම සහ කොවිඩ් 19 වසංගත ව්‍යාප්ති තත්ත්වය මත විවිධ රටවල් අතර සංචාරය තහනම් කිරීම හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුව සැලසුම් මට්ටමට පසුගාමී විය. | කාර්යය කඩිනම් කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |

### 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ගිවිසුම් අත්සන් කරන ලද 2016 වර්ෂයේ සිට වර්ෂ දෙකකට පසු, එනම් 2018 වර්ෂයේ ණය උපයෝජනය ආරම්භ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ණය නියෝජිතායතනය විසින් 2020 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය නොකළ ණය ශේෂය මත බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 318.70 ක් අය කරගෙන තිබුණි. | සැලසුම් හා අධීක්ෂණ උපදේශන කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදනය ප්‍රමාද වීම හේතුවෙන් සිදු වු මුලික ප්‍රමාදය නිසා කාර්ය ආරම්භ කිරීම හා ණය උපයෝජනය ආරම්භ කිරීම ප්රමාද විය. | ව්‍යාපෘති කාර්යය කඩිනම් කිරීමට ක්‍රියා කල යුතුය. |

### 2.3 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| මුදල් රෙගුලාසි 133 සහ 2016 ජූනි 10 දිනැති කලමනාකරණ විගණන චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ගනුදෙනු අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් කර ඇත. වාර්තාව ඉදිරිපත් කරනු ඇත. | අභ්‍යන්තර විගණන වාර්තා කාලීනව ඉදිරිපත් කිරීමට ක්‍රියා කළ යුතුය. |

## 2.4 පෙර විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද නොවිසඳුනු ගැටළු

| විගණන නිරීක්ෂණය<br>-------------------- | කළමනාකරණයේ අදහස් දැක්වීම<br>------------------------- | විගණකගේ නිර්දේශ<br>-------------------- |
| --- | --- | --- |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ අපජල පිරිපහදු පිරියත ඉදිකිරීමට සැලසුම් සකස් කර තිබූ අතර පිරිපහදු පිරියතේ සැලසුම් කිරීමේ කොටස මෙම ව්‍යාපෘතිය මගින් නිම කිරීමට නියමිත විය. තවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඒ සඳහා ඉඩමක් තෝරාගෙන තිබූ අතර අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2014 වර්ෂය අවසානයේ අරඹා 2019 ජුනි 17 වන විට නිම කර තිබුණි. කෙසේ වුවද, ඉඩම් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවා තිබූ අත්තිකාරම් මුදල් ආපසු අය කර ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගොනු කරන ලද නඩුවේ තීන්දුව ප්‍රමාද වීම මත 2021 ජුනි 30 දින වන විටත් ඉඩමේ නිත්‍යානුකූල හිමිකම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීම කරගෙන යමින් පවතී. ජේද 38A නිකුත් කර ඇති බැවින් ඉඩමට ඇතුළුවීමට වර්තමානයේ බාධාවක් නොපවතී. තක්සේරුව සඳහා විස්තරාත්මක මැණුම් සිතියම ලැබෙන තෙක් සිටියි.<br><br>මෙයට අමතරව, එන්ඩබ්එස්ඩීබී හි නීති අංශය මඟින් නඩුව පිළිබඳ කටයුතු කරයි. | ඉඩම් අත්පත් කර ගැනීම ඵලදායීව, අර්පීකව හා කාර්යක්ෂම අයුරින් සිදුකල යුතුය. |